සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

51 S I

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2016

**Third Term Test - Grade 13 - 2016**

විභාග අංකය .................................   චිත්‍ර I   කාලය පැය තුනයි

උපදෙස් - මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විතය.

1 කොටස - ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න.

11 කොටස - අනු කොටස් තුනකින් සමන්විතය.
එක් කොටසකින් ප්‍රශ්නය බැගින් තෝරා ගෙන, ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

1 කොටස හා 11 කොටසට අදාල පිළිතුරුපත් එකට අමුණා භාර දෙන්න.

## I කොටස

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් යෝග්‍ය පිළිතුර පහත සඳහන් A B C D E යන කැටයම් ඇතුළත් පින්තූර ඇසුරින් තෝරන්න.**


A


B


C


D


E

01. A අක්ෂරයෙන් දැක්වෙන කැටයම තුළින් දේශීය කැටයම් කරුවාගේ කුසලතාව කැපී පෙනේ. මෙය, (.......)

1. ඇම්බැක්කේ දේවාලයේ දේශීය හේවායා නම් කැටයමයි.
2. පනාවිටිය අම්බලමේ හේවායා නම් කැටයමයි.
3. ඇම්බැක්ක දේවාලයේ දේශිය හේවාය දක්වෙන පනේල කැටයමයි.
4. ඇම්බැක්ක දේවාලයේ විදේශීය හේවායා දැක්වෙන පනේල කැටයමයි.
5. පනාවිටිය අම්බලමේ විදේශීය හේවායා දැක්වෙන පනේල කැටයමයි.

02. B අක්ෂරයෙන් දැක්වෙන කැටයම, (.........)

1. ඇම්බැක්කේ දේවාලයේ පනේල කැටයම් අතර දැකිය හැකිය.
2. යාපහුවේ මාළිගාවේ පාදමේ කැටයමු අතර දැකිය හැකිය.
3. ගඩලාදෙණිය විහාරයේ පාදමේ කැටයම් අතර දැකිය හැකිය.
4. මිහින්තලේ වාහල්කඩ බොරදම් කැටයම් අතර දැකිය හැකිය.
5. රුවන්වැලි සෑ වාහල්කඩ කැටයම් අතර දැකිය හැකිය.

03. C අක්ෂරයෙන් දැක්වෙන මුරගල පිළිබඳ වඩාත් උචිත කියමන වන්නේ, (.........)

1. තිභංග හැඩයෙන් යුත් නා රජ රුවක් සහිත එකම මුරගලයි.
2. අනුරාධපුර යුගයට අයත් හොඳම මුරගලයි.
3. පොළොන්නරු වටදාගෙයි නා රජ රුව සහිත මුරගලයි.
4. කලාත්මක අතින් ඉහළම රුව සහිත මුරගලයි.
5. අර්ධ උන්නත ශිල්ප ක්‍රමයට අනුව පොළොන්නරු යුගයේ හමුවන මුරගලයි.

04. D අක්ෂරයෙන් පෙන්වා ඇත්තේ මිහින්තලේ ඛණ්ඨක චෛත්‍යයේ වාහල්කඩය. එහි ඇත් රුවින් සංකේතවත් වන්නේ, (.........)

1. උතුරු දිශාවය. 2. නැගෙනහිර දිශාවය. 3. බටහිර දිශාවය.
4. දකුණු දිශාවය. 5. නිරිත දිශාවය.

05. E අක්ෂරයෙන් දැක්වෙන මෙම කැටයම් නිර්මාණය කිරීමේ දී, (.........)

1. අල්ප උන්නත ශිල්ප ක්‍රමය භාවිත කර ඇත. 2. අර්ධ උන්නත ශිල්ප ක්‍රමය භාවිත කර ඇත.
3. පූර්ණ උන්නත ශිල්ප ක්‍රමය භාවිත කර ඇත. 4. පසාරු කැටයම් ශිල්ප ක්‍රමය භාවිත කර ඇත.
5. අධි උන්නත ශිල්ප ක්‍රමය භාවිත කර ඇත.

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න.**

06. නිශ්චල ද්‍රව්‍ය අධ්‍යයනයේ දී වස්තූන්ගේ යථා ස්වරූපය ඇඳීමට අවධාරණය කරනුයේ, (.........)

1. වස්තූන්ගේ ස්වභාවය හඳුනාගෙන එහි ඇති ගති ලක්ෂණ ප්‍රකාශ කිරීමේ හැකියාව ලැබෙන බැවිනි.
2. තමාගේ අභිමතය පරිදි වස්තූන්ගේ පරිමාණය වෙනස් කල හැකි බැවිනි.
3. අවස්ථාව මනඃකල්පිතව ඇඳිය හැකි බැවිනි.
4. දකින දේ ඇඳීම පහසුවන බැවිනි.
5. තමන්ගේ රුචිකත්වය මත වර්ණ වෙනස් කල හැකි බැවිනි.

07. වර්තමානයේ බහුලව භාවිත වන මුද්‍රණ ක්‍රමය හඳුන්වන්නේ, (.........)

1. සේද රාමු මුද්‍රණ ක්‍රමය ලෙසය. 2. ඩිජිටල් මුද්‍රණ ක්‍රමය ලෙසය.
3. සිදුරු තහඩු මුද්‍රණ ක්‍රමය ලෙසය. 4. මොනෝ ප්‍රින්ට් මුද්‍රණ ක්‍රමය ලෙසය.
5. ඔෆ්සෙට් මුද්‍රණ ක්‍රමය ලෙසය.

08. පැරණි චිත්‍ර ශිල්පීන් චිත්‍ර වර්ණ ගැන්වීම සඳහා ස්වභාවික පරිසරයෙන් ලබා ගත් ද්‍රව්‍ය භාවිත කොට වර්ණ සදාගෙන ඇත. ඒ අනුව කහ වර්ණය සාදාගෙන ඇත්තේ, (.........)

1. ගොකටු ගස්වලිනි. 2. නිල් ඇඹරිය ගස්වලිනි. 3. පතඟි ගස්වලිනි.
4. කොරකහ ගස්වලිනි. 5. දඹ ගස්වලිනි.

09. යුරෝපයේ පුනර්ජීවන යුගයේ පැවති ශාස්ත්‍රාලීය චිත්‍ර කලා අභිබවා උපස්ථිතිවාදය බිහිවීමට හේතු වූයේ, (.........)

1. රාජකීය ශාස්ත්‍රාලීය සැලෝනය විසින් නව මතධාරී ශිල්පීන් පෙළඹීම නිසාය.
2. එකල පැවති චිත්‍ර සම්ප්‍රදාය බොහෝ දෙනා ප්‍රතික්ෂේප කල බැවිනි.
3. නිදහස් මතධාරීන් නව ආරක් සොයමින් සිටි බැවිනි.
4. චිත්‍ර කලාව එක තැන පල්වූ බැවිනි.
5. රාජකීය ශාස්ත්‍රාලීය සම්ප්‍රදායන් ප්‍රතික්ෂේප කොට නව මං පෙත් සොයා යාමට නිදහස් මතධාරී ශිල්පීන් පෙළඹුන බැවිනි.

10. මහනුවර යුගයේ ඉදි වූ බුදුපිළිමවල දෙනෙත් විවෘතව ඉදිරිය බලා සිටින අයුරින් නිර්මාණය කර ඇත්තේ,

1. බුදුන් වහන්සේ දේවාතිදේව ලෙස දැක්වීමටය. (.........)
2. නරඹන්නා තුළ ගෞරව සම්ප්‍රයුක්ත බියක් දනවීමටය.
3. නරඹන්නා තුළ බිය ජනක ශ්‍රද්ධාවක් දනවීමටය.
4. දේව රූපවල ලක්ෂණ අනුකරණය කළ බව දැක්වීමටය.
5. ශිල්පීය කුසලතා පිළිබඳව හැඟීමක් ඇතිකරලීමටය.

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර F G H I J අක්ෂර මගින් දැක්වෙන මූර්ති ඇසුරින් තෝරා අදාල තිත් ඉර මත ලියන්න.**



F G H I J

11. F අක්ෂරයෙන් දැක්වෙන නටරාජා මූර්තියෙහි දකුණු පාදයෙන් වාමනයකු පාගාගෙන සිටියි. මෙයින් අදහස් වන්නේ, (.........)

1. අවිද්‍යාව දුරුකිරීමයි. 2. විශ්වයේ දෙදරීමයි. 3. ඥානය හා විනාශකාරී බවයි.
4. අවිද්‍යාව මර්දනය කල බව 5. ආශීර්වාදයයි.

12. G අක්ෂරයෙන් දැක්වෙන මයිරන්ගේ කවපෙත්ත විසිකරන්නා නම් මූර්තියෙන්, (.........)

1. හැඟීම් බර බව නිරූපණය වේ. 2. ආවේගශීලී බව නිරූපණය වේ. 3. සුන්දර බව නිරූපණය වේ
4. චලනය නිරූපණය වේ. 5. ප්‍රකාශනාත්මක බව නිරූපණය වේ.

13. H අක්ෂරයෙන් දැක්වෙන මෙම මූර්තිය, (.........)

1. හුණු ගලින් නිමවා වර්ණාලේප කර ඇත. 2. කලු ගලින් නිමවා වර්ණාලේප කර ඇත.
3. කිරිගරුඬින් නිමවා වර්ණාලේප කර ඇත. 4. ගඩොලින් කරවා වර්ණාලේප කර ඇත.
5. බදාමෙන් කරවා වර්ණාලේප කර ඇත.

14. I අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය, (.........)

1. ලෝකඩින් වාත්තු කල අඟල් 4½ ක ප්‍රතිමාවකි.
2. කිරිගරුඬින් කල අඩි 4½ ක ප්‍රතිමාවකි.
3. කලුගලින් කල අඩි 4½ ක ප්‍රතිමාවකි.
4. පුළුස්සන ලද මැටියෙන් කල අඟල් 4½ ක ප්‍රතිමාවකි.
5. දැවයෙන් කරන ලද අඩි 4½ ක ප්‍රතිමාවකි.

15. J අක්ෂරයෙන් දැන්වෙන මෙම මූර්තියෙන් නිරූපණය වන්නේ, (.........)

1. රෝම මූර්තියක් වන ඔගස්ටර් සීසර්ය.
2. රෝම මූර්තියක් වන ජුලියස් සීසර්ය.
3. රෝම මූර්තියක් වන කැරකලා මූර්තියය.
4. පුනර්ජීවන යුගයේ මූර්තියක් වන ඩේවිඩ් ප්‍රතිමාවය.
5. පුනර්ජීවන යුගයේ මූර්තියක් වන මෝසස් ප්‍රතිමාවය.

- **ප්‍රශ්න අංක 16 - 20 දක්වා පිළිතුරු සැපයීමේ දී K L M N O නමින් හඳුන්වා ඇති රූප සටහන් උපයෝගී කරගන්න.**


K


L


M


N


O

16. ඉහත රූප සටහන් අතරින් ඇස් මට්ටමේ දැකිය හැකි රූප සටහන වන්නේ, (.........)

1. K රූප සටහනය.
2. L රූප සටහනය.
3. M රූප සටහනය.
4. N රූප සටහනය.
5. O රූප සටහනය.

17. ත්‍රිමාන හැඩ සහ ගති ලක්ෂණ පෙන්වන ලද රූප සටහන් වනනේ, (.........)

1. N සහ O ය. 2. L සහ N ය. 3. L සහ O ය. 4. K සහ L ය. 5. M සහ O ය.

18. ඇස් මට්ටමින් පහළ තබා ඇති ද්‍රව්‍ය සඳහන් රූප සටහන වන්නේ, (.........)

1. L අක්ෂරයය. 2. N අක්ෂරයය. 3. O අක්ෂරයය. 4. M අක්ෂරයය. 5. K අක්ෂරයය.

19. ඉහත රූප සටහන් අතරෙන් පර්යාවලෝකනය මැනවින් නිරූපණය කෙරෙන අක්ෂරය වන්නේ, (.........)

1. K අක්ෂරයය. 2. M අක්ෂරයය. 3. O අක්ෂරයය. 4. L අක්ෂරයය. 5. N අක්ෂරයය.

20. සිලින්ඩරාකාර හැඩ පදනම් කර ඇති වස්තු සහිත රූප සටහන් වන්නේ, (.........)

1. K සහ L ය. 2. M සහ N ය. 3. L සහ M ය. 4. K සහ M ය. 5. N සහ O ය.

- අංක 21 සිට 25 දක්වා අසා ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර P Q R S T රූප සටහන් මගින් දැක්වෙන ගොඩනැගිලි ඇසුරින් තෝරන්න.







P Q R S T

21. P අක්ෂරයෙන් දැක්වෙන පුනුදු යුගයට අයත් ගෘහ නිර්මාණ අංගය වන්නේ, (.........)
    1. සිස්ටයින් දෙව් මැදුරේ දොරටුවයි.
    2. හේගියා සොෆියා දෙව් මැදුරේ දොරටුවයි.
    3. දෙවන ජුලියස් පාප් තුමාගේ සොහොන් ගෙයයි.
    4. ඩෙලා ග්‍රෙසී දේවස්ථානයේ අල්තාරයේ පිටුපසයි.
    5. ප්‍රොපීලියා දේවස්ථානයේ පිටුපස පිවිසුමයි.

22. Q අක්ෂරයෙන් දැක්වෙන ගෘහ නිර්මාණ අංගය නිර්මාණය කළ ශිල්පියා වන්නේ, (.........)
    1. දෙවරගම්පල සිල්වත් තැනය. 2. දෙල්මඩ මූලාචාරිය. 3. දේවේන්ද්‍ර මූලාචාරිය.
    4. හිරියාලේ සිත්තර නයිදේය. 5. කොස්වත්තේ සිත්තර නයිදේය.

23. R අක්ෂරයෙන් දැක්වෙන ගොඩනැගිල්ල බයිසන්තියානු ගෘහ නිර්මාණ ශිල්පයේ අග්‍රගන්‍ය ප්‍රතිඵලයකි. එය,
    1. ඇපොලිනරි නෝවෝ දෙවොල නම් වේ. 2. සැන් විටාලේ දෙවොල නම් වේ. (.........)
    3. චාටුස් දෙවොල නම් වේ. 4. හේගියා සොෆියා දෙවොල නම් වේ.
    5. නොට්‍රෙඩෑම් දෙවොල නම් වේ.

24. S අක්ෂරයෙන් දැක්වෙන වාස්තු විද්‍යාත්මක නිර්මාණය (.........)
    1. පොළොන්නරු යුගයට අයත්ය. 2. ගම්පොල යුගයට අයත්ය. 3. මහනුවර යුගයට අයත්ය.
    4. පල්ලව යුගයට අයත්ය. 5. අනුරාධපුර යුගයට අයත්ය.

25. T අක්ෂරයෙන් දැක්වෙන්නේ, (.........)
    1. ලැස්කෝ ගුහා පංතියයි. 2. අජන්තා ගුහා පංතියයි. 3. එල්ලෝරා ගුහා පංතියයි.
    4. ඇල්ටමීරා ගුහා පංතියයි. 5. දඹුලු ගුහා පංතියයි.

- අංක 26 සිට 30 තෙක් අසා ඇති ප්‍රශ්නවලට පහත සඳහන් U V W X Y යන චිත්‍ර ඇසුරෙන් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.


U


V


W


X


Y

26. U අක්ෂරයෙන් දැක්වෙන සිතුවමින් ආගමික හැඟීම් හා ශාන්ත රසයක් ජනිත කරවන බව විචාරක මතයයි. එය, (.........)
   1. ජෝර්ජ් කීට් ශිල්පියාගේ නිර්මාණකි.
   2. ජෝන් මිල්රෝයි ශිල්පියාගේ නිර්මාණකි.
   3. එච්.ඒ. කරුණාරත්න ශිල්පියාගේ නිර්මාණකි.
   4. එම්. සාර්ලිස් ශිල්පියාගේ නිර්මාණකි.
   5. එල්.ටී.පී. මංජු ශ්‍රී ශිල්පියාගේ නිර්මාණකි.

27. ශ්‍රී ලාංකීය චිත්‍ර කලාවේ සම්භාව්‍ය යුගයකට හිමිකම් කියන V අක්ෂරයෙන් දැක්වෙන චිත්‍රය, (.........)
   1. අනුරාධපුර යුගයට අයත්ය.
   2. ගම්පොල යුගයට අයත්ය.
   3. යාපහුව යුගයට අයත්ය.
   4. පොළොන්නරු යුගයට අයත්ය.
   5. දඹදෙණි යුගයට අයත්ය.

28. W අක්ෂරයෙන් දැක්වෙන්නේ මෝගල් චිත්‍රයකි. එය නම් කර ඇත්තේ, (.........)
   1. සාජහන් රජුගේ පුතුන් තිදෙනා යනුවෙනි.
   2. අක්බර් නාම යනුවෙනි.
   3. කොටි දඩයම යනුවෙනි.
   4. කේදාර් රාගිනී නමිනි.
   5. තෝඩි රාගිනී නමිනි.

29. X අක්ෂරයෙන් දැක්වෙන තරු පිරි රැය නම් චිත්‍රය අඳින ලද ශිල්පියා, (.........)
   1. උපස්ථිතිවාදී ශිල්පියෙකි.
   2. පශ්චාත් උපස්ථිතිවාදී ශිල්පියෙකි.
   3. ඝනිකවාදී ශිල්පියෙකි
   4. අමූර්තවාදී ශිල්පියෙකි.
   5. ඩාඩාවාදී ශිල්පියෙකි.

30. Y අක්ෂරයෙන් දැක්වෙන චිත්‍රයෙන් මහනුවර යුගයේ පහතරට සම්ප්‍රදාය පිළිබිඹු වේ. කතළුව පූර්වාරාමයට අයත් මෙම සිතුවම උපුටාගෙන ඇත්තේ, (.........)
   1. මහා සුතසෝම ජාතකයෙනි.
   2. වෙස්සන්තර ජාතකයෙනි.
   3. චුල්ල ධර්මපාල ජාතකයෙනි.
   4. පටාචාරා කතා වස්තුවෙනි.
   5. සොරෙය්‍ය සිටාණන්ගේ කතා වස්තුවෙනි.

- **අංක 31 සිට 35 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

31. ආකාශ ගංගාවරෝහණ කැටයම දක්නට ඇත්තේ, (.........)

    1. සාරානාත්හිය. 2. එල්ලෝරාහිය. 3. අමරාවතියේය. 4. අජන්තාවෙහිය. 5. මාමල්ලපුරම්හිය.

32. මිනිස් සිරුරේ සමානුපාතික සූත්‍රය නැමැති චිත්‍රය නිර්මාණය කළ ශිල්පියා, (.........)

    1. මයිකල් ඇන්ජලෝය. 2. ලියනාඩෝ ඩාවින්චිය. 3. වෙරකියෝය.
    4. බොට්ටි ෂෙල්ලිය. 5. රෆායෙල් සාසියෝය.

33. ඉන්දියානු නිර්මාණයක් වන රාධාගේ විරහව චිත්‍රය, (.........)

    1. ජෙමිනි රෝයි ශිල්පියාගේය. 2. නන්දලාල් බෝස් ශිල්පියාගේය.
    3. අම්රිතා ශර්ගිල් ශිල්පියාගේය. 4. අබිනින්ද්‍රනාත් ඨාගෝර් ශිල්පියාගේය.
    5. ඩගස්නේ රොඩින් ශිල්පියාගේය.

34. මෝගල් කලාව පදනම් කරගෙන බිහිවූ ප්‍රාදේශීය කලා සම්ප්‍රදායක් වන රාජ්පුත් කලාවට තේමා වූයේ,

    1. මෝගල් රජ පවුලේ සිදුවීම්ය. 2. ඉස්ලාම් දහමේ සිදුවීම්ය. (.........)
    3. හින්දු සාහිත්‍යය. 4. රජ පවුලේ ප්‍රභූන්ගේ උඩුකය රූපය.
    5. පරිසරයේ චමත්කාරයය.

35. රතු, කළු, නිල්, කහ සංයෝජනය නැමැති අමූර්තවාදී සිතුවම, (.........)

    1. පියේ මොන්ඩ්‍රියන් ශිල්පියාගේ නිර්මාණයකි. 2. සැල්වදෝර් ඩාලි ශිල්පියාගේ නිර්මාණයකි.
    3. ජෙමිනි රෝයි ශිල්පියාගේ නිර්මාණයකි. 4. විසිලි කන්දින්ස්කි ශිල්පියාගේ නිර්මාණයකි.
    5. මාක් චාගල් ශිල්පියාගේ නිර්මාණයකි.

● අංක 36 සිට 40 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර පහත සඳහන් චිත්‍රය ඇසුරෙන් තෝරන්න.



36. මෙම සිතුවම නිර්මාණය කරන ලද්දේ, (.........)

1. වින්සන්ට් වැන්ගෝ විසිනි. 2. ක්ලෝඩ් මොනේ විසිනි. 3. එඩ්වාඩ් මැනේ විසිනි.
4. කැමිලි පිසාරෝ විසිනි. 5. පෝල් ගොගැන් විසිනි.

37. මෙම චිත්‍රය නම් කර ඇත්තේ, (.........)

1. රාත්‍රී අවන්හල නමිනි. 2. හිරගෙදර ආලින්දය නමිනි. 3. තහිටි ලඳුන් නමිනි.
4. දෙවියන්ගේ දිනය නමිනි. 5. සැල්ටින් බාර්නැක් පවුල නමිනි.

38. මෙම සිතුවමින්, (.........)

1. ශිල්පියාගේ මානව ක්‍රියාකාරකම් ප්‍රකාශ වේ. 2. ශිල්පියාගේ කාව්‍යමය හැඟීම් ප්‍රකාශ වේ.
3. ශිල්පියාගේ කුරිරු බව ප්‍රකාශ වේ. 4. ශිල්පියාගේ හැඟීම් ප්‍රකාශ වේ.
5. ශිල්පියාගේ වේගවත් බව ප්‍රකාශ වේ.

39. මෙම සිතුවම සම්පිණ්ඩනය කර ඇත්තේ, (.........)

1. සිරකරුවන්ගේ දුක වේදනාව පිළිබිඹු වන ලෙසය. 2. සිරකරුවන් පේළියේ යන ආකාරයය.
3. හමුදා බණ්ඩයක පෙරහුරුවක් ලෙසය. 4. ව්‍යායාමවල යෙදෙන හමුදා බණ්ඩයක් ලෙසය.
5. සීතලෙන් මිදීමට කරන උත්සහයක් ලෙසය.

40. මෙම සිතුවම නිර්මාණය කළ පශ්චාත් උපස්ථිතිවාදී ශිල්පියාගේ අරමුණ වූයේ, (.........)

1. ආලෝකය ගැන නොසලකා චිත්‍ර ඇඳීමය.
2. ගැඹුර ගැන පමණක් සලකා චිත්‍ර ඇඳීමය.
3. ආලෝකයේ වෙනස්වන ස්වභාවය අධ්‍යයනය කිරීමය.
4. සැලෝනයෙන් ඉවත්වී චිත්‍ර ඇඳීමය.
5. කැපී පෙනීම සඳහා චිත්‍ර ඇඳීමය.

# 13 ශ්‍රේණිය - චිත්‍ර I

## II කොටස

- මෙය අනු කොටස් තුනකින් සමන්විතය.
- එක් කොටසකින් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

### 'අ' කොටස

### සංස්කෘතික පසුබිම හා රසාස්වාදය

### ශ්‍රී ලංකාව

2. මහනුවර යුගයේ විහාර සිතුවම් කලාව තුළින් බෞද්ධ බැතිමතුන් ශ්‍රද්ධාවෙන් පෝෂණය කර සුමගට යොමු කළ හැකි විය.

   i. මෙවැනි සිතුවම් දැකිය හැකි කන්ද උඩරටට අයත් විහාර ස්ථාන දෙකක් නම් කරන්න.

   ii. අඛණ්ඩ කථන ක්‍රමය චිත්‍ර නිර්මාණ සඳහා යොදා ගැනීමෙන් ප්‍රයෝජන රැසක් අත්පත් කර ගැනීමට ශිල්පීන් සමත් විය. කෙටියෙන් පහදන්න.

   iii. ජාතක කථා නිරූපණය තුළින් දාන පාරමිතාවේ මහිමය බැතිමතුන් වෙත පහදාදීමට මහනුවර ශිල්පියා උත්සාහ ගෙන ඇත. දෙගල්දොරුව විහාරයේ වෙස්සන්තර ජාතකය දැක්වෙන කතා සමූහය ඇසුරෙන් පහදන්න.

3. පොළොන්නරු යුගයේ ඇති වූ හින්දු ආගමික ගෘහ නිර්මාණ කලාවේ ලක්ෂණ ගම්පොල යුගයේ දී ද නොඅඩුව දක්නට ලැබුණු අතර නව නිර්මාණ බිහි වූ අවස්ථා ද දක්නට ඇත.

   i. ඇම්බැක්කේ දෙවොල මේ යුගයේ බිහි වූ නව නිර්මාණයකි. මෙහි ඇති කැටයම් දෙකක් නම් කරන්න.

   ii. අම්බැක්කේ ශිල්පියා දැව කණු මධ්‍යයේ වූ සිව්රැස් පනේල කැටයම් තුළින් තම ප්‍රතිභාව දැක්වීමට සමත්ව ඇත. ඒ තුළ දැක්වෙන කැටයම් වර්ග කර උදාහරණ දෙක බැගින් දෙන්න.

   iii. මේ යුගයේ බිහි වූ ගඩලාදෙණිය විහාරය දකුණු ඉන්දීය විජයනගර් ගෘහ නිර්මාණ ලක්ෂණ, බෞද්ධ සංස්කෘතික ලක්ෂණ හා ගැලපීමට ගත් උත්සාහයකි. ප්‍රතිමා ගෘහය හා විජයොත්පාය ඇසුරෙන් විමසන්න.

## 'ආ' කොටස

## සංස්කෘතික පසුබිම හා රසාස්වාදය

## ඉන්දියාව

4. ගාන්ධාර දේශයේ බෞද්ධ කලාව ඇරඹෙන්නේ කණිෂ්ක ප්‍රමුඛ කුෂාණයින් ගාන්ධාරයේ ආධිපත්‍යයට පැමිණීමෙන් පසුවය.
   i. ගාන්ධාර කලාව තුළ හමුවන බුදු පිළිම දෙකක් නම් කරන්න.
   ii. ගාන්ධාර පිළිමවල දැකිය හැකි විශේෂ ලක්ෂණ පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
   iii. ගාන්ධාරයේ ඇරඹුණු පිළිම කර්මාන්තය සමකාලීන වෙනත් ගුරුකුල දක්වා ද පැතිර ගිය අතර එම ගුරුකුල තුළින් උසස් ගණයේ ගුණාත්මක පිළිම නිර්මාණය විය. උදාහරණ සහිතව පහදන්න.

5. ඉන්දියාවේ බෞද්ධ කලා නිර්මාණ අතර සාංචි ස්තූපය හා සම්බන්ධ තොරණ කැටයම්වලට හිමිවනුයේ අද්විතීය ස්ථානයකි.
   i. බුදුන් දැක්වීමට බෝධිය සංකේතවත්ව යොදා ගත් අවස්ථා දෙකක් නම් කරන්න.
   ii. ඉන් එකක නිරූපිත පුවත සැකවින් විස්තර කරන්න.
   iii. සාංචි කැටයම් අතර ඔබ වඩා කැමති කැටයමක් පිළිබඳ ඇගයීමක් කරන්න.

## 'ඉ' කොටස

## සංස්කෘතික පසුබිම හා රසාස්වාදය

## යුරෝපය

6. රෝමවරුන් තමන්ගේ කලාවන් පෝෂණය කර ගැනීමේ දී ග්‍රීකයින්ගෙන් ලැබූ ආභාෂය ඉමහත්ය. මුල් යුගයේ දී ග්‍රීක කෘති අනුකරණය කළ රෝමන්වරු පසුව වාස්තු නිර්මාණවලින් මෙන්ම මූර්ති නිර්මාණයෙහි ද විශිෂ්ඨ දක්ෂකම් පෑමට සමත් විය.
   i. ගොඩනැගිලි නිර්මාණයේ දී රෝමවරු ග්‍රීකයින්ගෙන් ලබාගත් කුලුනු දෙක නම් කරන්න.
   ii. ''ප්ලේවියන් ඇම්ෆියටර් රංග පීඨය'' රෝම ගෘහ නිර්මාණ ශිල්පයේ අභිමානය කියාපාන ශ්‍රේෂ්ඨ නිර්මාණයකි. මෙහි ගෘහ නිර්මාණ ආකෘතිය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
   iii. රෝමන්වරු ආරම්භයේ දී ග්‍රීකයන් අනුකරණය කළ ද ග්‍රීක නිර්මාණ අභිභවා යාමට සමත් වූ අයුරු ඔවුන්ගේ මූර්ති තුනක් ඇසුරෙන් විමසන්න.

7. ''ඝණිකවාදය'' නම් නව ප්‍රවණතාවයක් කළ අනාගත කලා ලොවට නව මාවතක් එක් කළ ශිල්පියෙකු ලෙස පැබ්ලෝ පිකාසෝපෙන්වාදීමට පුළුවන.
   i. ඔහුගේ කලා දිවියෙහි වර්ගීකරණ දෙකක් නම් කරන්න.
   ii. ''අවිග්නොන්හි යුවතියෝ'' නමැති සිතුවම පිකාසෝගේ ඝනිකවාදී කලාවේ මූලාරම්භය සනිටුහන් කරන්නකි. මෙහි ඝනිකවාදී ලක්ෂණ කෙටියෙන් පහදන්න.
   iii. ඔහුගේ කලා දිවියේ වර්ගීකරණයට අනුව සිතුවම් තුළින් දිස්වන ලක්ෂණයන් පිළිබඳ ඇගයීමක යෙදෙන්න.